--------------------------------------------------------------------------------------------------------------

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව -** 2014

**-----------------------------------------------------**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය, 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1** **මතය**

**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------**

**2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු**

**-----------------------------------------------**

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි ඇපයෙන් සීමාසහිත සමාගමක විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධූරය දරා තිබුණි. මෙම සභාව සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,990,679 ක් ගෙවා අන්තර්ජාල පහසුකම් ලබාගෙන තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල මෙම සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**------------------------------------------**

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02**

**---------------------------------------------------**

නව ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා වැය කරන ලද රු. 20,220,330 හා ඒ මත කරන ලද ක්‍රමක්ෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් දරන ලද එකතුව රු.893,271 ක වියදම් නිරවුල් කර ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ශිෂ්‍යාධාර ගෙවීම සඳහා ත්‍රිකුණාමල මණ්ඩපයට ලබා දුන් රු.1,000,000 ක අත්තිකාරම්, 2015 මැයි 30 දින වන විටත් පියවා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පුද්ගලික ආයතන 15 ක් සඳහා ණය හිමි කාලය වර්ෂ 3 ක් ඉක්ම වූ එකතුව වූ රු.857,356 ක ණය හිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණ වලට අනුකුල නොවීම**

**---------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති සහ රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1993 දෙසැම්බර් 31 දිනැති අංක පීපීඒ/6/1/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ 8.6 ඡේදය | විදේශ නිල සංචාරයක යෙදී ආපසු පැමිණීමෙන් දින 07 ක් ඇතුළත චක්‍රලේඛ ලිපියෙහි ඊ ඇමුණුමෙහි ඇති ආකෘතිය අනුව වාර්තාවක් විදේශ ගමන අනුමත කළ බලධාරියා වෙත ඉදිරිපත් කලයුතු වුවද නියැදි පරීක්ෂාව අනුව 2014 වර්ෂයේ විදේශ ගමන් සඳහා සහභාගී වූ නිලධාරීන් 9 දෙනෙකු විසින් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) XIV වැනි පරිච්ඡේදයේ 3 ඡේදය | රාජකාරී ගමන් බිමන් යායුත්තේ ආණ්ඩුවට අඩුම වියදමක් දැරීමට සිදුවන ආකාරයට වුවද මහාමාර්ග ප්‍රවාහන ක්‍රම පැවතියදීත් ඒ පිළිබඳ අවධානය යොමු නොකර විධිමත් අනුමැතියකින් තොරව 2014 වර්ෂය තුළදී ආයතනය විසින් එකතුව රු.187,400 ක අභ්‍යන්තර ගුවන් ගමන් වියදම් සිදුකර තිබුණි. |
| (ii) XIX වැනි පරිච්ඡේදයේ 5.4 ඡේදය | රජයේ නිල නිවාස ලබා ගැනීමට හිමිකමක් ඇති නිලධාරියකුගේ වැටුපෙන් සියයට 12 1/2 ක් කුලිය වශයෙන් අයකර ගත යුතු වුවත් ටොරින්ටන් නිල නිවාසයේ 2014 වර්ෂය තුළදී පදිංචිව සිටි නිලධාරියෙකුගෙන් අදාළ කුලී මුදල් අය කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) XIX වැනි පරිච්ඡේදයේ 5.8 ඡේදය | ජලය හා විදුලිය සඳහා ගාස්තු අදාල නිවාසයේ පදිංචි නිලධාරියා විසින් ගෙවිය යුතු වුවද ටොරින්ටන් නිල නිවස හා තිඹිරිගස්යාය නිල නිවසෙහි 2014 වර්ෂයේ විදුලිය සහ ජලය වෙනුවෙන් පිළිවෙලින් රු.206,186 ක් හා රු.18,282 ක් කොමිෂන් සභාව විසින් ගෙවීම් කර තිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි අංක 396 (ඈ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ එකතුව රු. 36,319 ක් වූ චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2007 ඔක්තෝබර් 27 දිනැති අංක 45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමඟ ඒ පිළිබඳ කොමිෂන් සභා වගකීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ එවැනි ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි. |

**3.**

**මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 43,733,945 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.15,196,647 ක අතිරික්තයක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.28,537,298 කින් වැඩිවීම සඳහා රාජ්‍ය ප්‍රදාන රු.197,427,237 කින් වැඩි වීමද, අනෙකුත් ආදායම් රු.4,890,624 කින් වැඩිවීම සහ පුනරුත්ථාපන වියදම් රු.6,610,271 කින් අඩු වීමද, ක්ෂය සහ ක්‍රමක්ෂය රු.2,866,743 කින් අඩු වීමද විශේෂයෙන් බලපා තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

**-------------------------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව උසාවියේ හා අනෙකුත් ආයතනවල නෛතික සිද්ධීන් 44 ක් විභාග වෙමින් පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පසුගිය වර්ෂ 04 ක් සඳහා විශ්වවිද්‍යාලවලට බඳවා ගත් සිසුන් සංඛ්‍යාව හා දරන ලද පුනරාවර්තන වියදම් වල සාරාංශයක් පහත දැක්වේ.

| | **2013/2014** | **2012/2013** | **2011/2012** | **2010/2011** |
|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 143,740 | 144,816 | 141,411 | 142,516 |
| විශ්වවිද්‍යාලයට ඇතුලත් කිරීමට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 25,200 | 22,943 | 28,937 | 22,016 |
| | **2014** | **2013** | **2012** | **2011** |
| විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලයට තෝරාගත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස | 18 | 16 | 20 | 15 |
| දරන ලද පුනරාවර්තන වියදම (රු. 000) | 20,637,741 | 16,932,456 | 14,611,003 | 12,961,095 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 83,725 | 80,324 | 73,295 | 77,657 |
| එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම (රු.) | 246,494 | 210,802 | 199,345 | 166,902 |

(i) 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 18 ක් පමණක් විශ්වවිද්‍යාලවලට බඳවා ගෙන තිබුණු අතර එම අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 25,200 ක් තෝරාගෙන තිබුණද සිසුන් 23,019 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි.

(ii) ඒක ශිෂ්‍ය සාමාන්‍ය පුනරාවර්තන වියදම 2013 හා 2014 වර්ෂ සඳහා පිළිවෙලින් රු.210,802 ක් හා රු.246,494 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී ඒක ශිෂ්‍ය සාමාන්‍ය වියදම රු.35,692 කින් වැඩි වී තිබුණි.

(ආ) උපාධි පාඨමාලා සඳහා තෝරාගැනීමට සැලසුම් කර තිබුණු ප්‍රමාණයට වඩා අඩුවෙන් ලියාපදිංචි වීම සිදු වී තිබුණු බව විශ්වවිද්‍යාල 03 ක තෝරාගත් පාඨමාලාවන් කිහිපයක ලියාපදිංචිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. 2015 මාර්තු 31 දිනට තත්ත්වය පහත දැක්වේ.

| විශ්වවිද්‍යාලය | පාඨමාලාව | යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව | 2015/03/31 දිනට ලියා පදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු ශිෂ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|---|
| කැලණිය | පරිවර්තන අධ්‍යයන | 25 | 23 | 02 | 08 |
| | භෞතික විද්‍යාව | 245 | 207 | 38 | 15 |
| මොරටුව | මෝස්තර නිර්මාණ ශිල්පය | 50 | 36 | 14 | 28 |
| ඌව වෙල්ලස්ස | පරිගණක විද්‍යාව හා තාක්ෂණය | 60 | 57 | 03 | 05 |
| | ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | 65 | 56 | 09 | 14 |

- මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි නොවූ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 05 ත් සියයට 28 ත් අතර පරාසයක පැවතුනි. මේ සම්බන්ධව තව දුරටත් කරන ලද පරීක්ෂාවේදී ඉකුත් වර්ෂවලදී

ශිෂ්‍යයන් 2000 කට පමණ විශ්වවිද්‍යාල තුළ පහසුකම් පැවතියදීත් ඇතුළත් වීමට නොහැකි වූ බව පෙනී යයි.එම ප්‍රමාණය අවම කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම වැදගත් වේ.

(ඈ) ක්‍රීඩා ක්ෂේත්‍රයට ලබා දී තිබුණු සුවිශේෂී අවස්ථාවක් ලෙස ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණ/ ශාරීරික අධ්‍යාපනය යන අංශයන්හි උපාධි පාඨමාලාවක් හැදෑරීමට ක්‍රීඩා ක්ෂේත්‍රයේ උපරිම දක්ෂතා ඇති සිසුන්ට අවස්ථාව ලබා දී තිබුණු අතර, ඒ සඳහා විවෘත විශ්වවිද්‍යාලයේ එක් අවුරුදු පදනම් පාඨමාලාවක් සාර්ථකව අවසන් කළ යුතු වුවද 2010/2011, 2011/2012 හා 2012/2013 අධ්‍යයන වර්ෂවල පදනම් පාඨමාලාවට ලියාපදිංචි වී තිබුණු සිසුන් පස් දෙනෙකුගෙන් එක් සිසුවකු පමණක් පාඨමාලාව සාර්ථකව අවසන් කර තිබුණි. එසේ වුවද පදනම් පාඨමාලාව සමත් නොවූ සිසුන් දෙදෙනෙකුද උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කරවාගෙන තිබුණි.

(ඈ) 2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 11/0211/521/005 අනුව අධ්‍යයන වර්ෂ කීපයක් සඳහා දේශීය විශ්වවිද්‍යාල වලට විදේශ සිසුන් බඳවා ගැනීමේදී යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව හා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව අතර විචලතාවයක් පැවති අතර 2013/2014 අධ්‍යයන වර්ෂයේ දී පාඨමාලා 99 කට බඳවා ගැනීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව 1,250 ක් වූ නමුත් බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 41 ක් වූ බැවින් යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 3 ක් පමණක් බඳවාගෙන තිබුණු නමුත් අදාළ විදේශ සිසුන් බඳවා නොගැනීම හේතුවෙන් පවතින සම්පත් දේශීය සිසුන් වෙනුවෙන් යොදා ගැනීමක් හෝ වෙනත් විධිමත් ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂණය අනුව 2014 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අටක ගිවිසුම් කඩකල නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල රු.485,116,701 ක් වුවද විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ **v** පරිච්ඡේදයේ 7.6, 7.7 හා 7.8 අනුව එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා විශ්වවිද්‍යාල යොමු කරවීම සඳහා සකසා දී ඇති ක්‍රමවේදය ක්‍රියාත්මක කරවීම සහ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා වැඩිපුර ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීම මූලික පදනම ලෙස තබාගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වෙත කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2014 ප්‍රකාරව සියයට 20 ක දීමනාවක් ලබා දී ඇති අතර, වැඩිපුර ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා නොගත් උසස් අධ්‍යාපන ආයතන සඳහාද එනම් පශ්චාත් උපාධි ආයතන හා උපාධි ප්‍රදාන නොකරන ආයතන සඳහාද මෙම දීමනාව ලබා දී තිබුණි. එසේම වැඩිපුර සිසුන්ගේ අධ්‍යාපන කටයුතු නිමවීමත් සමග මෙම අතිරේක ගෙවීම තව දුරටත් සිදුවීම සම්බන්ධයෙන් ඇති වන තත්ත්වයද විගණනයට ගැටළු සහගත විය.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර එකඟතාවයකින් තොරව කොමිෂන් සභා තීරණය මත පමණක් සංග්‍රහ වියදම් සඳහා වැටුප් මත පදනම් වූ සියයට 8 සිට සියයට 20 දක්වා දීමනාවක් ලබා දීම සඳහා 2014 මාර්තු 26 දිනැති අංක 6/2014 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී රු.537,566 ක් සංග්‍රහ වියදම් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණි.

(ආ) ගිවිසුම් කඩකිරීම් වලින් අයකරගත් මුදල් රාජ්‍ය ආදායමක් වුවත් අවම වශයෙන් විශ්වවිද්‍යාල අරමුදලට බැර නොකර 1998 අගෝස්තු 18 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 ට අනුව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගිවිසුම් කඩකල අචාර්යවරුන්ගේ අරමුදලක් (Bond Violation/ Breach Fund) එක් එක් විශ්වවිද්‍යාල විසින් නඩත්තු කර තිබූ අතර ඉන් ලැබෙන ආදායම විශ්වවිද්‍යාලවල විවිධ වියදම් සඳහා යොදා ගෙන තිබුණි. විශ්වවිද්‍යාල 11 ක් සම්බන්ධයෙන් සිදුකල නියැදි පරීක්ෂාවට අනුව මෙම අරමුදලේ එකතුව රු.217,931,691 ක් විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙම අරමුදලේ ශේෂය රු.1,064,971 ක් විය.

(ඇ) භාණ්ඩාගාර අනුමැතිය සහිතව නිකුත් කළ යුතු චක්‍රලේඛ හා නියෝග අදාළ අනුමැතියකින් තොරව නිකුත් කළ අවස්ථා ගණනාවක් නිරීක්ෂණය විය.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

**----------------------------**

(අ) ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා කොමිෂන් සභාව විසින් අරමුදල් ගිණුම් 30 ක් පවත්වා තිබූ නමුත් අදාළ කාර්ය සඳහා අරමුදල් ගිණුම් 3 ක් පමණක් උපයෝගී කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ අරමුදල් වල වටිනාකම රු.22,042,557 ක් වූ අතර උපයෝජනය නොකළ ගිණුම් වල ශේෂය රු.17,861,870 වූයෙන් එය සමස්ථ වටිනාකමින් සියයට 81 ක් විය. එම මුදල් එම කාර්ය සඳහා යොදා ගැනීම වෙනුවට ආයෝජනය කර තිබුණි. ඉහත අරමුදල් වල ඇතුළත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්ම එම කාර්ය සඳහා ඇති කර ගෙන තිබූ අරමුදල් ගිණුමේ රු.8,895,678 ක ශේෂයක් පැවතුනද එම මුදල් ද අදාළ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) ගොඩනැගිලි හා ඉදිකිරීම් වෙනුවෙන් 2014 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු. 15,412,150 ක්ද පොත් හා ප්‍රකාශන වෙනුවෙන් 2013 හා 2014 වර්ෂවලදී ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.447,020 ක්ද සමාලෝචිත වර්ෂයේදී අදාල කාර්යයන් සඳහා යොදා නොගෙන උපයෝජනය නොකල ප්‍රාග්ධන ප්‍රදාන (unspent capital) ලෙස ගිණුම්වල පෙන්වා තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

2009 වර්ෂයේදී අවසන් වූ විදේශ අරමුදල් ව්‍යාපෘතියක ජංගම ගිණුම් ශේෂය වූ රු.277,940 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද ගිණුම්වල අක්‍රීයව පැවතුණි.

**4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**----------------------------------**

යෝජිත මහල් ගොඩනැගිල්ලෙහි කාල රාමුව ප්‍රකාරව 2015 ජනවාරි 07 දින වන විට ඉදිකිරීම් ආරම්භ කිරීම සිදු කළ යුතු වුවද 2015 ජුනි 30 දක්වා ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

**----------------------------**

කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 293 ක්ද තත්‍ය කාර්ය මණ්ඩලය 214 ක්ද වූ යෙන් කාර්ය මණ්ඩලය 79 දෙනෙකුගේ ඌනතාවයක් නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී. 12 දරන චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණු අතර ආදායම් හා වියදම් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණි. තවද අයවැය ලේඛනය ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තා හා සමගාමී නොවූ හෙයින් ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය උපයෝගී කර ගෙන තිබූ බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අරමුදල් පාලනය
(ආ) කාර්ය මණ්ඩල පාලනය
(ඇ) මුදල් හා බැංකු
(ඈ) ගිණුම්කරණය